ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/11/05/23

# මාධ්‍ය නිවේදනය

විවිධ වූ සමාජ, ආර්ථික කරුණු සහ අභ්‍යන්තර සහ බාහිර සංක්‍රමණ හේතුකොට ගෙන ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීමේ ප්‍රවනතාවයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. එහිදී ගෘහස්ථව ජීවත්වන වැඩිහිටියන් මෙන්ම ආයතනගත වැඩිහිටියන්ද විවිධාකාරයේ ගැටළුවලට මුහුණදෙන තත්වයක් දක්නට ඇත.

ඒ අනුව එම කණ්ඩායම් වල හිමිකම් සුරක්ෂිත කිරීමේදී පොලීසිය මඟින් සුවිශේෂී කාර්යයන් මේවන විටත් ඉටුකරමින් සිටින අතරම, එම කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව තුළ වැඩිහිටියන් වෙනුවෙන් වෙන් වූ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වමින් අද දින එනම් 2023.05.11 වන දින පොලිස්පතිතුමා වෙත නිර්දේශයක් නිකුත් කරන ලදී.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.05.11